සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**තෙවන වාර පරීක්ෂණය 2017** | **06 ශ්‍රේණිය**
மூன்றாம் தவணைப் பரீட்சை **2017** | தரம் **06**
**Third Term Test 2017** | **Grade 06**

**බුද්ධ ධර්මය - I කොටස**

**කාලය :- පැය දෙකයි**
***Two hours***

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

- **1 සිට 5 දක්වා ප්‍රශ්නවලට හරි නම් (✔) ලකුණද වැරදි නම් (×) වැරදි ලකුණද යොදන්න.**

1. සියලු සතුන්ට මෛත්‍රී කළ යුතු ආකාරය කරණීයමෙත්ත සූත්‍රය තුළින් දේශනා කර ඇත. ( )
2. මේ ලොව නිහඬ සුන්දර පරිසරයට බෙහෙමින් ඇලුම් කළ ශ්‍රේෂ්ඨ පරිසරවේදියාණෝ බුදු රජාණන් වහන්සේය. ( )
3. ශ්‍රී ලංකාවට බුදු දහම ලැබීමෙන් පසු ඉදිකල මුල්ම චෛත්‍ය රුවන්වැලි මහා සෑයයි. ( )
4. මහින්දාගමනයෙන් පසු ශ්‍රී ලංකාවේ ඉදි වූ මුල්ම ගොඩනැගිල්ල කාලපාසාද පිරිවෙනයි. ( )
5. බුද්ධ ශාසනයේ පැවිද්ද ලැබූ මුල්ම ශ්‍රී ලාංකිකයා ලෙස ඉතිහාස ගත වන්නේ අරිට්ඨ කුමාරයයි. ( )

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

6. බුදු රජාණන් වහන්සේ කැඩපතින් මුහුණ බැලීම උපමා කොට ගනිමින් අඩුපාඩු සකස් කරගත යුතු ආකාරය දක්වමින් ධර්මය දේශනා කළේ,

   1. සැරියුත් තෙරුණ්ටය   2. මුගලන් තෙරුන්ටය   3. රාහුල තෙරුන්ටය

7. ලොව පවතින පණ ඇති පණ නැති සෑම දෙයක්ම වෙනස් වීමට යටත් වේ. මෙම වෙනස්වීම බුදුදහම හඳුන්වන්නේ

   1. දුක්ඛ ලෙසය   2. අනාත්ම ලෙසය   3. අනිත්‍යතාව ලෙසය

8. තමා උපමා කොට ගෙන අන් අයට වැඩ පිණිස හේතු වන ක්‍රියා සිදු කළ යුතුය. මෙය බුදු දහමේ ඉගැන්වෙන්නේ,

   1. ත්‍රිලක්ෂණය නමිනි.
   2. ත්‍රිකෝටි පාරිශුද්ධිය නමිනි
   3. අත්තූපනායික ධර්ම පර්යාය නමිනි

9. ලෝක පරිසර දිනය යෙදී ඇත්තේ,

   1. ජුලි 04 2. ජුනි 05 3. මැයි 05

10. දුමින්දාගමනය හෙවත් බෝධි ආගමනය සිදු වූයේ,

   1. පොසොන් පුර පසළොස්වක දායි
   2. වෙසක් පුර පසළොස්වක දාය
   3. උඳුවප් පුර පසළොස්වක දාය

- **11 සිට 15 දක්වා ප්‍රශ්න සුදුසු පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

11. දේවානම්පියතිස්ස රජතුමා විසින් සංඝමිත් තෙරණිය ඇතුලු භික්ෂූන් වහන්සේලා උදෙසා සෑදූ ආරාමය .............................................. ලෙස හඳින්වේ.

12. දැඩි ලෝභය විනාශයට හේතු වන බව .............................................. ජාතක කථාවෙන් පෙන්වා දෙයි.

13. සම්පත් ආරක්ෂා කර ගැනීමට අදාළ බොහෝ උපදෙස් .............................................. නිකායේ කුල සූත්‍රයේ සඳහන් වේ.

14. තෙරුවන් කෙරෙහි ඇති විශ්වාසය .............................................. ලෙස හැඳින්වේ.

15. බෞද්ධයෙකු තුළ තිබිය යුතු ශ්‍රද්ධාව .............................................. ශ්‍රද්ධාව නමින් හඳුන්වයි.

(ආකාරවතී / ස්වර්ණහංස / හත්ථාලක / මෙහෙණවර / අංගුත්තර / ශ්‍රද්ධාව )

- **16 සිට 20 දක්වා ප්‍රශ්න වලට ගැළපෙන පිළිතුර සහිත ඉංග්‍රීසි අක්ෂරය වරහන් තුළ යොදන්න.**

| (අ) | | | (ආ) |
|---|---|---|---|
| 16. සියලු කෙලෙසුන් නැසීමේ නුවණ | (   ) | A. | දූමින්දාගමනය |
| 17. බුදුරජාණන් වහන්සේ චතුරංග සමන්නාගත වීර්යය වැඩීමට සකස් කරගත් ආසනය | (   ) | B. | මහාභිනිෂ්ක්‍රමණය |
| 18. සිදුහත් කුමරු රජසැප හැරදමා ගිහි ගෙයින් නික්ම යාම | (   ) | C. | සිද්ධාර්ථ |
| 19. සංඝමිත්තා තෙරණින් වහන්සේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කරවීම | (   ) | D. | ආසවක්ඛය ඥාණය |
| 20. ලොවට යහපතක් හෙවත් අර්ථයක් සිදු කරන්නා යන අරුත | (   ) | E. | වජ්‍රාසනය |

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**තෙවන වාර පරීක්ෂණය 2017** | **06 ශ්‍රේණිය**
**மூன்றாம் தவணைப் பரீட்சை2017** | **தரம்06**
**Third Term Test 2017** | **Grade06**

**බුද්ධ ධර්මය - II කොටස**

- **පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්ණය අනිවාර්ය වේ.**

(01) I සබ්බේ තසන්ති දණ්ඩස්ස... යන ගාථා පාඨය ඇතුළත් ධර්ම ග්‍රන්ථය නම් කරන්න.

II පරිසරය ආරක්ෂා කර ගැනීමෙහිලා බුදුරජානන් වහන්සේ විසින් උපසම්පදා භික්ෂූන් වහන්සේලාට පැන වූ විනය නීති දෙකක් ලියන්න.

III ථූපාරාමය චෛත්‍ය ඉදි කිරීමේ දී එහි නිදන් කරන ලද්දේ බුදු රාජාණන් වහන්සේගේ කුමන ධාතූන් වහන්සේද?

IV ජීවකාරාම පූජා කථාව සඳහන් කෘතියෙහි නම කුමක්ද?

V ශ්‍රී ලංකික භික්ෂුණී සාසනයේ පැවිද්ද ලැබූ මුල්ම කාන්තාව ලෙස ගෞරවාදරයට පත් වූයේ කවුරුන්ද?

VI ශ්‍රද්ධාවේ ප්‍රධාන ප්‍රභේද නම් කරන්න.

VII පංච මහා විලෝකනය සඳහන් කරන්න

VIII දුම්වැටි මත් වතුර මත් කුඩු නොබොන්නෙමි

උන් කිසිවකු හටත් ඒවා නොදෙන්නෙමි

..................................................... .............................

..................................................... .............................

මෙම කවියෙන් කියවෙන ශික්ෂා පදය කුමක්ද?

IX සතර බ්‍රහ්ම විහරණ වලින් මෙත්තා ලෙස හඳුන්වන්නේ කුමක්ද?.

X දියුණුවේ රන් දොරටු 6 ක් පිළිබඳ බුදු දහමේ දැක්වේ. ඒ පිළිබඳ සඳහන් වන ජාතකය කුමක්ද?

(02) I "සියල්ලෝම දඬුවමින් තැති ගනිති. සියල්ලෝම ජීවිතයට ප්‍රිය වෙති. එහෙයින් තමා උපමා කොට අනුන් නොමරන්න" මෙම අදහස දෙන ගාථාව ලියන්න.

II ක්‍රියාවක හොඳ නරක තෝරා ගැනීමට යොදා ගත හැකි මිනුම් දඬු තුනක් ලියන්න.

III "හිංසනයෙන් වැළකීම" යන මාතෘකාව යටතේ වාක්‍ය 5 ක් ගොඩනගන්න.

(03) පරිසරයේ පවත්නා අගය ලොවට ප්‍රකාශ කළ ප්‍රථම පරිසරවේදියා බුදුරජාණන් වහන්සේය. උන්වහන්සේ පරිසරයේ පවත්නා වටිනාකම බොහෝ අවස්ථාවල දී දේශනා කර ඇත.

I පරිසර දූෂණය කෙරෙහි බලපෑම් ඇති කරන කරුණු දෙකක් ලියන්න.

II බුදුරජාණන් වහන්සේ වනරෝප සූත්‍රයේ දක්වා ඇති පරිදි පිං වැඩෙන ක්‍රියාවන් තුනක් ලියා දක්වන්න.

III ඔබගේ නිවස අවට පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා ඔබ අනුමනය කළ හැකි ක්‍රියා මාර්ග 5 ක් ලියා දක්වන්න.

(04) දඹදිව රජ කළ ධර්මාශෝක රජතුමාගේ ධර්ම ප්‍රචාරක කටයුතු අතරින් ඉතාම වැදගත් කාර්යය වූයේ ශ්‍රී ලංකාවට බුදු දහම ප්‍රචාරය කිරීමට ධර්ම දූත කණ්ඩායමක් පිටත් කර එවීමය.

I මිහිඳු හිමියන් සමඟ ලංකාවට වැඩම කළ භික්ෂූන් වහන්සේලා අතරින් සිව්දෙනෙක් නම් කරන්න.

II බුදු දහම මෙරටට ලැබීමෙන් පසු දේවානම්පියතිසස රජතුමා විසින් කරන ලද විහාරාරාම තුනක් සඳහන් කරන්න.

III මහින්දාගමනයෙන් අප ලත් දායාද 5ක් ලියන්න.

(05) I ශ්‍රද්ධාව යනු කුමක්ද?

II නියම ශ්‍රද්ධාවන්තයෙකු තුළ තිබිය යුතු ලක්ෂණ තුන මොනවාද?

III සැදැහැති දරුවන් වීමට අපට කළ හැකි ක්‍රියාවන් 5 ක් ලියන්න.

(06) I සාකේත නුවර සිටුතුමාගේ දේවියට වැළඳුණු හිසරුදාවට ප්‍රතිකාර කළ වෛද්‍යවරයාගේ නම කුමක්ද?

II කුල සූත්‍රයේ සඳහන් පරිදි සම්පත් අරපිරිමැස්මෙන් භාවිතා කළ යුතු ආකාර තුනක් දක්වන්න.

III තම පාසලේ සම්පත් ආරක්ෂා කර ගැනීම සඳහා ඔබ විසින් ගනු ලබන ක්‍රියාමාර්ග 05 ක් ලියන්න.

(07) I රාහුල හාමුදුරුවෝ රහත් බවට පත් වූයේ කුමන සූත්‍රය ඇසීමෙන්ද?

II රාහුල හාමුදුරුවන්ගේ චරිතයෙන් ලබා ගත හැකි ආදර්ශ තුනක් නම් කරන්න.

III ශිෂ්‍යයෙකු ලෙස ඔබ විසින් සිදු කරන ලද යහපත් ක්‍රියා 5 ක් ලියන්න.